මාර්තු, 2017

# පොදු ප්‍රවාහන බස් රථ හා දුම්රියවල ලිංගික හිංසනය

## ප්‍රශ්නය

**පොදු ප්‍රවාහන බස් රථ හා දුම්රියවලදී කාන්තාවන්ගෙන් 90%ක් ම ලිංගික හිංසනයට ලක් වන බව 2015දී එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල විසින් කරන ලද සමීක්ෂණයකදී[1] හෙළිදරව් විය.**

ලොව පුරා ම කාන්තාවෝ පොදු ප්‍රවාහනයේදී ලිංගික හිංසනයට මුහුණ දෙති. විවිධ ශාරීරික හා වාචික හිංසනයන් ලෙස සිදු වන මෙය ඇතැම් විට ස්ත්‍රී දූෂණය පවා විය හැකි ය. එය නිසා කාන්තාවන් තැනින් තැනට යාම සීමා වේ සමාජ ව්‍යුහයන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතාවන්ගේ ගැඹුර ද එමගින් පරාවර්තනය වේ. කාන්තාවන්ගේ හා ගැහැනු ළමයින්ගේ මූලික හිමිකම් හා නිදහස අහිමි කරනවාට අමතරව, අනාරක්ෂිත වාතාවරණයක් නිර්මාණය කිරීමට ද එය ඉවහල් වේ. එමගින් කාන්තාවන් හා ගැහැනු ළමයින් පොදු ජීවිතය තුළ, රැකියාවන්ගේ හා අධ්‍යාපනයේ සම්පූර්ණයෙන් නිමග්න වීම ද සීමා කරනු ලැබේ.

ආර්ථික වර්ධනය උත්තේජනය කිරීමෙන් සංවර්ධනයේ උත්ප්‍රේරකයක් වීමේ හැකියාව ශ්‍රී ලාංකිකයන් බහුතරයකට වඩාත් ම ලාභදායී ගමනාගමන විකල්පය වන පොදු ප්‍රවාහනයට තිබේ. කෙසේ වෙතත්, පොදු ප්‍රවාහනය වෙත පිවිසීමේදී හා භාවිතා කිරීමේදී කාන්තාවන් හා පිරිමින් අතර කැපී පෙනෙන විෂමතාවක් තිබේ. අධ්‍යයන මගින් පෙන්වා දී ඇති පරිදි කාන්තාවන් පිරිමින්ට වඩා පොදු ප්‍රවාහන සේවා මත යැපෙති. විශේෂයෙන් ම පහළ ආදායම් මට්ටම්වල කාන්තාවන් අතර මෙය දැකිය හැකි ය.[2] ගෘහාශ්‍රිත කටයුතුවලින් වැඩි බරක් දරා ගන්නට සිදු වන කාන්තාවෝ වඩා ලාභදායී ප්‍රවාහන මාධ්‍ය ඔස්සේ වැඩිපුර ගමන් කරති. එහෙත්, පොදු ප්‍රවාහනයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදු වන වෙනස්කම් නිසා කාන්තාවන්ගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබේ.

ශ්‍රී ලංකාව සිය ආර්ථික විභවයන් අත්පත් කර ගන්නට නම්, ශ්‍රම බලකායේ ජන සහභාගිත්වය උපරිම කර ගත යුතු ය. ශ්‍රම බලකායෙහි කාන්තා සහභාගිත්වයේ පහළ වැටීම තේරුම් ගන්නට නම් කාන්තාවන්ගේ ගැටලු කෙරෙහි සංවේදී විය යුතු ය.[3] ඒ පිළිබඳ හේතු ලෙස දක්වා තිබෙන කාරණා අතර, පොදු ප්‍රවාහනයේදී සිදු වන කාන්තා හිංසනය ද කාන්තාවන් ආර්ථික කටයුතුවලට සහභාගි වීම වළක්වන ප්‍රධාන බාධකයක් ලෙස සැලකේ.



ආර්ථික වශයෙන් සක්‍රිය විය හැකි වයසේ සිටින ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් රැකියාවල නියුක්ත වී සිටින්නේ

**34%**

ක් පමණි

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයේ වාර්ෂික වාර්තාව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2014)*

## ලිංගික හිංසනය යනු කුමක් ද?

''ඕනෑම අයෝග්‍ය ලිංගික බලපෑමක් හෝ ලිංගික සැලකීමක් සඳහා ඉල්ලීමක් හෝ ලිංගික ස්වරූපයේ වාචික නැතිනම් ශාරීරික ක්‍රියාවක් හෝ හැසිරීමක් හෝ වෙනත් අයෙකුට වරදක් හෝ අවමානයක් ඇති කරන බව සාධාරණ ලෙස පෙන්නුම් කරන වෙනත් ඕනෑම ආකාරයක ලිංගික ස්වභාවයේ චර්යාවක් ලිංගික හිංසනයක් ලෙස සැලකිය හැකි යී එය එක් සිද්ධියක් හෝ සිද්ධි මාලාවක් හෝ වීමට ද පුළුවන. ලිංගික හිංසනය සිතාමතා කරන ක්‍රියාවක්, ඉල්ලීමකින් තොරව කරන ක්‍රියාවක් හෝ බලහත්කාරයෙන් කරන ක්‍රියාවක් හෝ විය හැකි ය.''[4]

පොදු ප්‍රවාහනයේ ලිංගික හිංසනය නිවසේ, සේවා ස්ථානයේ හා පොදු අවකාශයන්හි සිදු වන ලිංගික හිංසනයන්ගේ එක් කොටසකි.

1 Sexual Harassment on public trains and buses, UNFPA (2015) {unpublished}
2 http://www.wrirosscities.org/sites/default/files/Final_Report_30072015.pdf
3 ජන හා නිවාස සංගණනය අනුව, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ශ්‍රම බලකා සහභාගිත්වය 2006දී 39.5%ක මට්ටමේ සිට 2014දී 34.7% දක්වා පහත වැටී තිබේ.
4 UNHRC Policy on harassment - http://www.un.org/womenwatch/osagi/UN_system_policies/(UNHCR)policy_on_harassment.pdf

පොදු ප්‍රවාහනයේ සිදු වන ලිංගික හිංසනය කාන්තාවන් හා ගැහැනු ළමයින්ට වෙනස් අන්දමින් සැලකීමේ සංස්කෘතියක් ඇති කිරීමට දායක වෙයි. එය ඔවුන් ශාරීරිකව, මානසිකව හා ආර්ථික වශයෙන් පීඩාවට පත් කරයි.

ජන හා නිවාස සංගණනය අනුව, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ශ්‍රම බලකා සහභාගිත්වය 2006දී 39.5%ක මට්ටමේ සිට 2014දී 34.7% දක්වා පහත වැටී තිබේ.

අධ්‍යයනයේ වැදගත් සොයා ගැනීමක් වන්නේ සමීක්ෂණයට මුහුණ දුන් කාන්තාවන්ගෙන් 50%ක් සිය සේවා ස්ථානයට යාම සඳහා පොදු ප්‍රවාහනය භාවිතා කරන බවයි. ඒ අනුව, මෙම ප්‍රශ්නය කාන්තාවන් ශ්‍රම බලකායෙහි සහභාගි වීම පහත වැටීමට ඉවහල් වන කාරණයක් ලෙස සැලකිය හැකි ය.

## ලිංගික හිංසනය පිළිබඳ නීතිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **12 (2) වගන්තිය** අනුව, **'කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේ ය'**

**වසර 1995 අංක 22** දරණ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනතේ 345 කොටස අනුව ද ලිංගික හිංසනය යනු දඬුවම් ලැබිය හැකි සාපරාධී වරදකි. **මෙම කොටස අනුව ලිංගික හිංසනය යටතට ලිංගික ස්වරූපී පහරදීම්, සාපරාධී බලය යෙදවීම, හිංසනයට ලක් වන පුද්ගලයා** කුපිත කිරීමට හේතු වන වචන හෝ ක්‍රියා අයත් වේ.

සමීක්ෂණය අනුව ප්‍රතිචාර දැක්වූවන්ගෙන්

**52%**

ක් ලිංගික හිංසනය අපරාධයක් ලෙස සැලකෙන නීතියක් තිබෙන බව දැන සිටිය හ.

කෙසේ වෙතත්,

**60%**

ක් දෙනා ලිංගික හිංසන වරදට දඬුවමක් තිබෙන බව දැන සිටියේ නැත.

## අධ්‍යයනය පිළිබඳව

වසර 2015 දෙසැම්බරයේදී එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් කාන්තාවන්ට පොදු ප්‍රවාහන බස්රථ හා දුම්රියවලදී මුහුණ දෙන්නට සිදු වන ලිංගික හිංසනය පිළිබඳ ජාතික සමීක්ෂණයක් පවත්වන ලදී. එහි අරමුණ වූයේ පොදු ප්‍රවාහනයේදී සිදු වන ලිංගික හිංසනයන්ගේ ස්වභාවය, එහි ප්‍රමාණය හා සිදු වන ආකාරය පිළිබඳ සවිස්තර අවබෝධයක් ලබා ගැනීම සඳහා ඉවහල් වන සමීක්ෂණ මත පදනම් වූ තොරතුරු ජනනය කිරීමයි.

පාර්ශ්වකාර සාකච්ඡා, වැදගත් තොරතුරු සපයන්නන් සමග සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි සමීක්ෂණයක් ඔස්සේ දත්ත ලබා ගන්නා ලදී. ඒ සඳහා යොදා ගන්නා ලද නියැදිය පුද්ගලයන් 2500ක් විය. පළාත් නවයේ ම සියලු දිස්ත්‍රික් නියෝජනය කරන වයස අවුරුදු 15-35 අතර පුද්ගලයෝ එයට අයත් වූ හ.

## වැදගත් සොයාගැනීම්



**90%**

ක් පැවසුවේ ඔවුන් පොදු ප්‍රවාහන බස් හා දුම්රියවලදී ලිංගික හිංසනයට ලක් වී තිබෙන බවයි

**සමීක්ෂණයට සහභාගි වූ කාන්තාවන් හා ගැහැණු ළමයින් මූලිකව ම පොදු ප්‍රවාහනය භාවිතා කළේ**



**50%** ක් වැඩට යාම සඳහා

**28%** ක් ඉගෙනුම පිණිස යාම සඳහා

**20%** ක් වෙනත් පෞද්ගලික අවශ්‍යතා සඳහා

## අවම වශයෙන් එක් වතාවක් හෝ මුහුණ දී තිබෙන ලිංගික හිංසන ස්වරූප

අධ්‍යයනය විසින් ලිංගික හිංසන ලෙස වර්ග කළ හැකි විවිධාකාර ක්‍රියා 35ක් හඳුනා ගන්නා ලදී. ඒවා ලිංගික ස්වරූපයේ ශරීර ස්පර්ශයේ සිට වාචික හා දෘෂ්‍යමය ක්‍රියා දක්වා විහිදේ. කෙසේ වෙතත්, සොයාගැනීම්වලින් දක්නට ලැබෙන්නේ මුහුණ දෙනු ලබන ලිංගික හිංසනයන්ගෙන් බහුතරය **ශාරීරික** බවයි.




### ලිංගික හිංසන අත්දැකීම් ලැබූ වාර ගණන







ක් ම පැවසුවේ වරද කරන්නා පිරිමි බවයි

## මෙයට ඉවහල් වන සාධක

### දුර

පොදු ප්‍රවාහන සේවාවන්හිදී ලිංගික හිංසනයන් සිදු වීම කෙරෙහි දුර අදාළ නො වේ. එහෙත්, අවධාන කණ්ඩායම් සාකච්ඡාවලදී සඳහන් වූ පරිදි, පොදු ප්‍රවාහනයේ ලිංගික හිංසනය සිදු වීමේ වැඩි ඉඩක් තිබෙන්නේ දුර ගමන් සේවාවන්හිදී ය. එහිදී වින්දිතයා දිගු කාල පරාසයන් තුළ හිංසනයට ලක් වේ.

### කාලය

මෙම ක්‍රියා වැඩිපුර සිදු වන්නේ උදෑසන හා සවස වැඩි පිරිසක් පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන කාල පරාසයන්හිදී ය. බස් රථවල හා දුම්රියවල අධික සෙනග තදබදය ලිංගික හිංසනයට දායක වන සාධකයකි. එහිදී විශේෂයෙන් ම අනවශ්‍ය ශරීර ස්පර්ශයන් සිදු වේ.

> වරක් මා ටියුෂන් පංතියකට යාමට බසයක ගමන් කරමින් සිටින විට, මා අසල වාඩි වී සිටි වයස අවුරුදු 15ක් පමණ වන පිරිමි ළමයෙක් බසයෙන් බැසීමට පෙර මගේ ඇඳුමේ ශුක්‍ර පහ කළේ ය. මට කළ හැකි කිසිවක් තිබුණේ නැත. මට මහත් අසරණකමක් දැනිණි. මා මෙය කිසිවකුට කීවේ නැත.
>
> *- අවධාන කණ්ඩායමක සාමාජිකයෙක්*

**37%** ක් පැවසුවේ මෙම සිදුවීම් ඔවුන්ගේ වැඩ කටයුතුවලට අහිතකර ලෙස බලපාන බවයි

**29%** ක් පැවසුවේ මෙම සිදුවීම් ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවලට අහිතකර ලෙස බලපාන බවයි

**ලිංගික හිංසනයේ භාවමය බලපෑම**

**76%** ක් කෝපයට පත් වූ හ

**68%** ක් අවමානයට හා ලජ්ජාවට පත් වූ හ

**48%** ක් බියට පත් වූ හ

**45%** කට පහත් තත්වයකට ඇද දමන ලද බව හැඟිණි

**44%** ක් පැවසුවේ එය තමන්ගේ පෞද්ගලික ජීවිතයට බල පෑ බවයි

> හෙදියක් ලෙස මට අවේලාවල්වල සේවය හමාර කරන්නට සිදු වෙනවා. එක් වතාවක් මා වැඩ නිම කර වෙහෙසින් යුතුව බසයට නැගුණු විට මට පිටුපසින් වාඩි වී සිටි පිරිමි මගියකු අනවශ්‍ය පරිදි මා ස්පර්ශ කරන්නට පටන් ගත්තා. ඔහු වයස අවුරුදු හතළිස්ගණන්වල සිටි හොඳින් ඇඳ පැළඳ සිටි අයෙකි. මා විරෝධය පළ කළ විට ඔහු මට කීවේ පෞද්ගලික වාහනයක යන ලෙසයි. මෙම සිද්ධිය නිසා මා ඉතා අපහසුවට පත් වුණා.
>
> *- අවධාන කණ්ඩායම් සාමාජිකයෙක්*

## ක්‍රියාමාර්ග ගැනීම

පොදු ප්‍රවාහන සේවාවන්හිදී, විශේෂයෙන් ම බස්වලදී, නිතර දක්නට ලැබෙන ප්‍රතිචාරයක් වන්නේ වින්දිතයන් හිංසනය අතරතුර මෙන් ම ඉන් පසුව ද නිහඬව සිටීමයි.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 92%ක් දෙනා පොදු ප්‍රවාහන සේවාවන්හිදී ලිංගික හිංසනයට ලක් වුව ද, නීතිමය බලධාරීන්ගෙන් කිසි විටෙක හෝ උපකාර පතා නැත. ලිංගික හිංසනය සිදු වන අවස්ථාවේ පොලිසියට පැමිණිලි කිරීම ඔවුන්ට ප්‍රායෝගිකව අපහසු වූ බව ද දක්නට ලැබිණි. එම සිදුවීම් දිගට සිදු වන්නේ නම්, කාන්තාවන් හා ගැහැනු ළමයින් පවුලේ අය හෝ මිතුරන් මාර්ගයෙන් පොලිසියට පැමිණිලි කරන්නට උත්සාහ කරන බව අධ්‍යයනයෙන් හෙළිදරව් විය.

කාන්තාවන් හා ගැහැනු ළමයින් පහත දැක්වෙන ආකාරවලින් ලිංගික හිංසනයට ප්‍රතිචාර දක්වන බව අවධාන කණ්ඩායම් සාකච්ඡාවන්හිදී දක්නට ලැබිණි.

1. පීඩකයා සිටින තැනින් වෙනත් තැනකට මාරු වීම (ආසන මාරු කිරීම වැනි)

2. ගමන යාම සඳහා වෙනත් බසයක් හෝ දුම්රියක් භාවිතා කිරීම

ලිංගික හිංසනයෙන් මිදීම සඳහා ගමනාගමනය සඳහා විකල්ප බස් හෝ දුම්රිය නැති අවස්ථාවලදී වින්දිතයන් ඇතැම් විට පදිංචිය මාරු කර ඇති බව ද අධ්‍යයනයෙන් වාර්තා විය.

## අසල සිටින්නන්ගේ මැදිහත් වීම




ක් දෙනා පැවසුවේ, වෙනත් අය ලිංගික හිංසනයට ලක් වන ආකාරය තමන් දැක ඇති බවයි

### අසල සිටින්නන්ගේ ප්‍රධාන කාර්යභාරය

බොහෝ විට, ලිංගික හිංසනයක් හෝ ප්‍රහාරයක් සිදු වන විට, වින්දිතයා හා වැරදිකරුවා අසල වෙනත් අය සිටිති. ඔවුන් සිද්ධියෙහි සාක්ෂිකරුවන් විය හැකි ය. අසල සිටින්නෙකු යනු කිසියම් සිදුවීමක් වන විට ඒ අසල සිටින හෝ සිද්ධියට හේතු වූ තත්වයන් දකින අයෙකු විය හැකි ය. එහෙත්, එම පුද්ගලයා සිද්ධිය සමග ඍජුව සම්බන්ධ නැත.

යම් ලිංගික හිංසන සිදුවීමක් නිරීක්ෂණය කළ විට හෝ එය පිළිබඳ අවදි කිරීමක් සිදු කළ විට බස්රියවල හෝ දුම්රියවල වෙනත් මගීන් එයට මැදිහත් වීම සිදු වන්නේ ඉතා කලාතුරකින් බව අධ්‍යයනයෙන් පෙනේ. අවධාන කණ්ඩායම් සාකච්ඡාවලදී හඳුනා ගත් පරිදි මෙයට ප්‍රධාන හේතු වන්නේ ගැටුම්වලට මැදි වීමේ අවදානම ගැනීමට ඇති අකැමැත්ත හා තමන් කෙරෙහි අවධානය යොමු වීම කෙරෙහි ඇති අකැමැත්තයි.

> පිරිමි මගීන් කුඩා ගැහැනු ළමයින් අනවශ්‍ය පරිදි ස්පර්ශ කරන හෝ ඇඟට හේත්තු වී සිටින ආකාරය මම බොහෝ අවස්ථාවලදී දැක ඇත්තෙමි. කුඩා ළමයින් බස්රියවලට ගොඩ වන විට බස් කොන්දොස්තරලා ද ඔවුන් අනවශ්‍ය පරිදි ස්පර්ශ කරති.
>
> *- වැදගත් තොරතුරු සපයන්නෙක්*

## සහාය ලබා ගැනීම




ක් පොලිසියෙන් යම් ආකාරයක සහාය පැතූ හ




ක් දෙනා පොදු ප්‍රවාහන සේවාවලදී සිදු වන ලිංගික හිංසන පිළිබඳ පැමිණිලි කළ හැකි දුරකථන අංකයක් පිළිබඳ නො දන්නා බව කී හ

### මහජන ව්‍යාපාර

- පොදු ප්‍රවාහනයේදී සිදු වන ලිංගික හිංසනයන් පිළිබඳ ජාතික වශයෙන් දැනුවත් කිරීම සඳහා මහජන ව්‍යාපාර ඉතා වැදගත් ය. පුද්ගලයන්ට මෙන් ම ප්‍රජාවන්ට එයින් සිදු වන අනර්ථයන් පිළිබඳ එමගින් දැනුවත් කළ හැකි ය.
- මාධ්‍ය විසින් මේ පිළිබඳ මහජන සාකච්ඡාවකට මුල පිරිය හැකි ය. රූපවාහිනී, රේඩියෝ, පුවත්පත්, සමාජ මාධ්‍ය මගින් පොදු ප්‍රවාහනයේ ලිංගික හිංසනය සිදු වන හැටි, අසල සිටින්නනට එයට මැදිහත් විය හැකි ප්‍රායෝගික ආකාර, එය වැළැක්වීම සඳහා සමාජ වෙනස්කම් සඳහා ව්‍යාපාර සහ වෙනත් මුලපිරුම් ගැන සාකච්ඡා කළ හැකි ය.
- මෙම කාරණය පිළිබඳ මහජන පණිවුඩ දිරිමත් කළ යුතු ය. ඒවා චර්යා වෙනස් කිරීමේ සන්නිවේදන මූලෝපායන් සඳහා භාවිතා කළ හැකි ය. ලිංගික හිංසනය නො ඉවසීම හා එවැනි සිදුවීම්වලට එරෙහිව ක්‍රියා කිරීම දිරි ගැන්විය හැකි ය.

## නිර්දේශ

### 1. පාර්ශ්වකරුවන් ප්‍රතිපත්ති මැදිහත්වීම් සඳහා නිමග්න කර ගැනීම

පොදු ප්‍රවාහනය හා සම්බන්ධ මෙහෙයුම් හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ කාරණා අදාළ කර ගත හැකි ආකාර හඳුනා ගැනීම සඳහා ජාතික සංකථනයක් පැවැත්විය යුතු ය. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට, තක්සේරු කිරීමට හා අධීක්ෂණය කිරීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් තිබිය යුතු ය.

### 2. ප්‍රතිචාර දැක්වීමේ හා පැමිණිලි විභාග කිරීමේ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහනය තුළ ආරක්ෂිත ගමනාගමන සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා කාර්යක්ෂම ආයතනික වෙනස්කම් ඇති කළ යුතු ය.

- වාර්තා කිරීම ශක්තිමත් කිරීම සඳහා, ඒ වෙනුවෙන් ම වෙන් කරන ලද උපකාරක සේවාවක් පිහිටුවිය යුතු ය. එය නිසි ප්‍රමිතියකින් ක්‍රියාත්මක විය යුතු ය. දුරකථන ඇමතුම් ලබා ගන්නන්ගේ සිට නීති ක්‍රියාත්මක කරන නිලධාරීන් දක්වා සැම විසින් අනුගමනය කළ යුතු ප්‍රමිතිගත මෙහෙයුම් ක්‍රියාවලි මාර්ගෝපදේශ සැකසිය යුතු ය
- ලිංගික හිංසන ක්‍රියා නිරීක්ෂණයේදී හා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ප්‍රවාහන ආරක්ෂාව හා පොලිසිය අතර සම්බන්ධීකරණය වර්ධනය කළ යුතු ය
- ලිංගික හිංසනයන්ට මුහුණ දෙන පුද්ගලයන්ට ක්ෂණිකව පැමිණිලි කිරීම සඳහා බස් නැවතුම්පළවල හා දුම්රිය ස්ථානවල යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු ය
- සංවර්ධනය කරන ලද ප්‍රමිතිගත මෙහෙයුම් ක්‍රියාවලි මාර්ගෝපදේශ පිළිබඳ සහ පොදු ප්‍රවාහන සේවාවන්හිදී සිදු වන ලිංගික හිංසනයන් පිළිබඳ පැමිණිලි හැසිරවීම පිළිබඳ පොදු ප්‍රවාහන නිලධාරීන්ට පුහුණුව ලබා දී ඇති බව තහවුරු කරන්න
- නගර වෙත පිවිසීමේදී, නගර තුළ සහ පොදු අවකාශවල ගමනාගමනයේදී සහ චලනයේදී කාන්තාවන් හා ගැහැනු ළමයින් මුහුණ දෙන අත්දැකීම් තක්සේරු කිරීම සඳහා නිරන්තර ආරක්ෂක විගණනයන්[5] සිදු කරන්න. එමගින් පොදු ප්‍රවාහනයේදී සිදු වන ලිංගික හිංසනය පිළිබඳ ගැටලුව ආමන්ත්‍රණය කිරීම සඳහා දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනයට උපකාර කළ හැකි ය

5 Women's Safety Audits: What works and where? UN-HABITAT http://mirror.unhabitat.org/downloads/docs/7381_86263_WICI.pdf

## 3. කාන්තාවන් සහ ගැහැනු ළමයින් සිය හඬ අවදි කිරීම සඳහා බලාත්මක කිරීම

පොදු ප්‍රවාහනයේදී සිදු වන ලිංගික හිංසනයන්හිදී කාන්තාවන් සහ ගැහැනු ළමයින් බොහෝ විට නිහඬව සිටින්නේ එය සාමාන්‍ය අත්දැකීමක් ලෙස සැලකීමේ ප්‍රවණතාවක් තිබෙන නිසා ය. එබැවින් ලිංගික හිංසනය යනු වෙනස් අන්දමින් සැලකීමක් බව ද, ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය අනුව වරදක් බව ද, එයට එරෙහිව කතා කිරීමට හා සහාය පැතීමට පුද්ගලයාට හිමිකමක් ඇති බව ද දැනුවත් කිරීමේ ව්‍යාපාර විසින් පැහැදිලිව පහදා දිය යුතු ය. විශේෂයෙන් ම කාන්තාවන් සහ ගැහැනු ළමයින් ඇතුළුව, ලිංගික හිංසනයට ලක් වන ඕනෑම පුද්ගලයකුට, රටේ පිහිටුවා තිබෙන ප්‍රතිචාර පද්ධතිය ඔස්සේ එය පිළිබඳ අදාළ බලධාරීන්ට වාර්තා කිරීමේදී සුරක්ෂිතබවක් හා තමන් බලවත් බවක් දැනිය යුතු ය.

පොදු ප්‍රවාහන පද්ධති භාවිතා කරන මගීන් වෙනුවෙන් කල්ක්‍රියා පද්ධතියක් හඳුන්වා දිය යුතු ය. මෙම කල්ක්‍රියා පද්ධතිය බස් හා දුම්රිය තුළ ප්‍රදර්ශනය කළ යුතු ය.

## 4. අසල සිටින්නන්ගේ මැදිහත් වීම දිරිගැන්වීම

කිසියම් හිංසන ක්‍රියාවක් සිදු වනු දුටු විට එයට මැදිහත් වීම / එය වැළැක්වීමේ හැකියාවක් අසල සිටින්නන්ට තිබේ. එමගින් වැරදි කරන්නන් අධෛර්ය කළ හැකි අතර සියලු පුද්ගලයන් වෙනුවෙන් වඩා සුරක්ෂිත වාතාවරණයක් නිර්මානය කිරීමට ඉවහල් වේ.

පොදු මුලපිරුම් විසින් අසල සිටින්නන්ගේ මැදිහත් වීම් දිරිගැන්විය යුතු ය. අසල සිටින්නන්ට වඩා අවදියෙන් සිටිමින් කාන්තාවන්ට හා ගැහැනු ළමයින්ට පොදු ප්‍රවාහන සේවාවලදී සිදු වන ලිංගික හිංසනයන් සම්බන්ධයෙන් සංවේදීව කටයුතු කර ගමනාගමන පරිසරය ආරක්ෂිත කිරීමට දායක විය හැකි ය.

**හිංසනය නැවැත්වීමේ හා වෙනත් අය තුළ ධනාත්මක චර්යා වෙනස්කම් ඇති කිරීමේ හැකියාව අසල සිටින්නන්ට තිබේ.**

### *අසල සිටින්නන්ගේ මැදිහත් වීම සඳහා උපදෙස්*[6]

### CARE

**CREATE-** අවධානය වෙනතකට යොමු කරන්න. අවස්ථාවට මැදිහත් වන්න අවදානමට මුහුණ දෙන පුද්ගලයාට වෙනත් ස්ථානයක් කරා යාමට එයින් අවස්ථාව ලැබෙනු ඇත

**ASK** - හිංසනයට ලක් වන පුද්ගලයාගෙන් උදව් අවශ්‍යදැයි විමසන්න

**REFER** - පොලිසිය වැනි බලධාරියකු වෙත යොමු කරන්නී බස් රියදුරාට හෝ කොන්දොස්තරට සිද්ධිය ගැන දන්වන්න

**ENLIST** - සිදුවීම වැළැක්වීම සඳහා වෙනත් අයගේ උපකාර ලබා ගන්න. හිංසනයට එරෙහිව කතා කරන පිරිස වැඩි වන විට තත්වය යහපත් අතට හැරේ

### Four D's

**DIRECT-** හිංසනය වැළැක්වීම සඳහා කෙළින් ම මැදිහත් වන්න. උදාහරණයක් ලෙස වරද කරන්නාට කතා කළ හැකි ය. වින්දිතයාගෙන් උදව් අවශ්‍යදැයි ඇසිය හැකි ය

**DISTRACT-** අවධානය වෙනතකට යොමු කරන්න. වින්දිතයා තව දුරටත් හිංසනයට ලක් වීම වැළැක්වීම සඳහා අවධානය වෙනතකට යොමු කරන්න

**DELEGATE-** බස් රියදුරු හෝ කොන්දොස්තර හෝ දැනුවත් කර යමක් කරන්නැයි කියන්න. වෙනත් මගීන් මේ පිළිබඳ අවදි කරන්න

**DELAY-** ප්‍රමාද කරන්න. ඔබට ඒ මොහොතේ ක්‍රියාත්මක වන්නට බැරි නම්, හිංසනයට ලක් වූ පුද්ගලයාට උපකාර අවශ්‍යදැයි විමසන්න

6 Bystander Intervention Techniques – Northwestern University https://sapac.umich.edu/article/bystander-intervention

## 5. රියදුරන් සහ කොන්දොස්තරවරුන් ප්‍රශ්නය කෙරෙහි සංවේදී කිරීම

මගීන් අතින් සිදු වන හිංසනයන් නැවැත්වීමේ බලය ඇති මුල් ම පුද්ගලයන් වන්නේ රියදුරා හා කොන්දොස්තරවරයා ය. අසල සිටින්නන්ගේ මැදිහත් වීමේදී මෙන් ම රියදුරන්ගේ හා කොන්දොස්තරවරුන්ගේ මැදිහත් වීමේදී ද මගීන් එහා මෙහා කර හිංසනය වැළැක්විය හැකි ය. වැරදිකරුවන් බස්රියෙන් ඉවත් කිරීම මෙන් ම අවශ්‍ය නම් පොලිසිය හා වෙනත් බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම ද ඔවුන්ට කළ හැකි ය.

### යෝජිත මැදිහත්වීම්

- බස් රියදුරන් හා කොන්දොස්තරවරුන් සඳහා ඵලදායී පුහුණු සැසි නිතිපතා පවත්වමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කම් හා නීතිමය වගවීම පිළිබඳව ඔවුන් දැනුවත් කළ හැකි යි ලිංගික හිංසනයන් සිදු වන අවස්ථාවලදී මැදිහත් වීමේ හා ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම්සහගතභාවය ඔවුන් තුළ ඇති කළ හැකි ය

- දැනට තිබෙන පුහුණු පහසුකම් විවරණය කර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය, ආරක්ෂාව, පරෙස්සම ආදිය පිළිබඳ දැනුම එහි තහවුරු කළ හැකි ය

- ලිංගික හිංසන ක්‍රියාවලට ප්‍රතිචාර දැක්වීම ඒවා වාර්තා කිරීම හා ඒවා ලේඛනගත කිරීම සම්බන්ධයෙන් පැහැදිලි මාර්ගෝපදේශ හා මූලධර්ම සකසන්න. රජයෙන් සහ නීති ක්‍රියාත්මක කරන අංශවලින් නිකුත් කරනු ලබන පණිවුඩ හා චක්‍රලේඛාදිය මගින් මෙම කටයුතු අනිවාර්ය කරන්න

**'ජනගහණ සංකථන'** යනු ශ්‍රී ලංකාවේ මතු වෙමින් තිබෙන සමාජ දේශපාලන කාරණා පිළිබඳ විශ්ලේෂණාත්මක ප්‍රතිපත්ති සාරාංශ මාලාවකි.

## ආශ්‍රිත ලේඛන


Asian Development Bank, 2015. Policy Brief: A Safe Public Transportation Environment for Women and Girls *http://genderinsite.net/sites/default/fles/safe-public-transport-women-girls.pdf*

Asian Development Bank, 2014. Rapid Assessment of Sexual Harassment In Public Transport and Connected Spaces in Karachi. Technical Assistance Consultant's Report. *https://www.adb.org/sites/default/fles/project-document/152881/44067-012-tacr-19.pdf*

Bystander Intervention Techniques - Northwestern University *https://sapac.umich.edu/article/bystander-intervention*

Engaging Bystanders to Prevent Sexual Violence Information Packet *http://www.nsvrc.org/publications/nsvrc-publications-information-packets/engaging-bystanders-prevent-sexual-violence*

Give Help - Bystander Intervention *http://www.actnowsrilanka.org/en/act-now/give-help*

Hollaback. 'How to respond to harassment' - *https://www.ihollaback.org/responding-to-harassers/*

Street Harassment: A bystander's guide *https://www.ihollaback.org/wp-content/uploads/2010/09/Final-Bystanders-Draft.png*

How to Respond to a  Survivor RAINN (Rape, Abuse & Incest National Network) *https://www.rainn.org/articles/how-respond-survivor*

National Census on Population and Housing 2012 – Department of Census and Statistics *http://www.statistics.gov.lk/PopHouSat/CPH2011/Pages/Activities/Reports/CPH_2012_5Per_Rpt.pdf*

Villa, Monique. Sexual harassment on public transport is a problem we must solve. The Independent *http://www.independent.co.uk/voices/comment/sexual-harassment-on-public-transport-is-a-problem-we-must-solve-9826153.html*

Women's Safety Audits: What works and where? UN-HABITAT *http://mirror.unhabitat.org/downloads/docs/7381_86263_WICI.pdf*

**එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල**
202, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7, ශ්‍රී ලංකාව

දුරකථනය: +94 (011) 2580840

/unfpa.srilanka @unfpasrilanka @unfpasrilanka srilanka.unfpa.org